**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. ඒ අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ පද්ධතිය සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී 2022 වර්ෂයේදී පද්ධතියට ඇතුලත් කර තිබූ දත්තයන් 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය තුල ජර්නල් සටහන් යෙදීමකින් තොරව එකතුව රු.1,155,529 ක් වූ ලදුපත් 144 ක් හා එකතුව රු.1,027,250 ක් වූ විකුණුම් ඉන්වොයිස් 96 ක් මකා දැමීම් (delete) හා සංශෝධනය කර තිබූ බව අනාවරණය විය. එසේම ගිණුම් පද්ධතියට දත්ත ඇතුලත් කරන නිලධාරීන්ට කිසිඳු පාලනයකින් තොරව දත්ත වෙනස් කිරීමේ අධිකාරී බලය ද ලබා දී තිබුණි. | විගණනයේ සඳහන් කර තිබෙන ආකාරයට ගිණුම් පද්ධතිය තුල නිවැරදි කිරීමට සිදුවන වැරදි නිවැරදි කිරීම් සීමා කිරීමට හා ඒ සඳහා විනිවිද භාවයෙන් යුතු විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා පරිගණක ගිණුම්කරණ මෘදුකාංගය තුල ඇති පහසුකම් පිළිබඳව සොයා බලා ඒවාද ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරන බව. | ගිණුම්කරණ පද්ධතිය නිරන්තරයෙන් පරීක්ෂාවට ලක්වන පරිදි විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතිකල යුතු අතර ගිණුම්කරණ පද්ධතිය තුල සිදු කල යුතු කාර්යයන් සඳහා සීමාවන් ඇති කල යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 වගන්තිය අනුව අධිකාරිය විසින් ඔවුන්ට හිමිකාරීත්වය නොමැති ඉඩම් 20 ක ඉදිකරන ලද ගොඩනැගිලිවල වටිනාකම හා අධිකාරියට අයිති ඉඩම් 08 ක් ද එම ඉඩම්වල ඉදිකර තිබූ ගොඩනැගිලිවල වටිනාකම ද තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කැබලි 29 න් 7 ක් තවම තක්සේරු කර නොමැති බැවින් තක්සේරු කර ඇති ඉඩම් කැබලි 22 හි වටිනාකම 2022 වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් නොකරන ලද බව. | ආයතනයට අයත් සියලු වත්කම් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේදී සිදුකල ප්‍රත්‍යාගණනයේදී හඳුනාගෙන තිබූ ප්‍රත්‍යාගණන අතිරික්තය ගිණුම් තැබීමේදී, 2018 වර්ෂයේදී සිදුකල වත්කම් ප්‍රත්‍යාගණනයේදී හඳුනාගෙන තිබූ රු.51,409,653ක් වූ ප්‍රත්‍යාගණන අලාභයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 52 ඡේදය අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්තය සහ ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ප්‍රත්‍යාගණන අතිරික්තය 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදිව ප්‍රත්‍යාගණන අතිරික්තය හෝ ඌනතාවය පිළියෙල කළ යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේදී මූල්‍ය කල්බදු පදනම යටතේ මිලදී ගත් මෝටර් රථ 03 කට අදාල මූල්‍ය කල්බදු වගකීම සහ පොලී වියදම ගිණුම් තැබීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 හි දක්වා ඇති පරිදි ව්‍යංග (implicit) පොලී අනුපාතිකය පදනම් කර නොගැනීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන සහ ජංගම කල්බදු වගකීම පිළිවෙලින් රු.1,177,479 ක් සහ රු.1,119,992 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්තය රු.2,297,471 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තාවේ පෙන්වාදීම් අනුව 2023 වර්ෂයේදී අදාල ගැලපීම් සිදුකර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 ට අනුව ගිණුම් තැබීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 30 දින ඉදිකිරීම් අවසන් කර අධිකාරිය වෙත භාරදී තිබූ පිරිවැය රු.7,743,902ක් වූ මාතර දිස්ත්‍රික්කයේ රුහුණුගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම එම අගයෙන් හා රඳවුම් මුදල් ගිණුමේ ශේෂය රු.398,158 ක් අඩුවෙන් ද කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.7,345,744 ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | අවසාන බිල්පත නොගෙවූ බැවින් 2022 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත වී තිබූ නමුත් 2023 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී ගොඩනැගිල්ලේ පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් අවසන් කර අධිකාරිය වෙත භාරදී තිබූ ගොඩනැගිලි ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි හා මෝටර් රථ වත්කම් පංති සඳහා ක්ෂය ගණනය කිරීමේදී 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල අත්පත් කරගත් වත්කම් වලට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ක්ෂය ගණනය කිරීමේදී ද්වි ගණනය වී තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වියදම රු.134,630,322ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2022 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | දැනට වත්කම් පන්ති හදුනාගෙන ඇති බැවින් 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ක්ෂය වටිනාකම් ගණනයකර මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී 2022/2023 අධ්‍යයන වර්ෂ සඳහා ආරම්භ කරන ලද අර්ධකාලීන පාඨමාලා 09 ක 2023 වර්ෂයට අදාල රු.3,054,300 ක වියදම් 2022 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අර්ධකාලීන පාඨමාලා ආරම්භ කරනු ලබන වර්ෂය පදනම් කර ගෙන ආදායම් වියදම් ගැළපුම් කර ඇති අතර ඉදිරියේදී එම පාඨමාලාවේ වර්ෂයට අදාළ කාලය පදනම් කරගෙන ආදායම් වියදම් ගැළපීමට කටයුතු කරන බව. | වර්ෂයේ ඌනතාවය/අතිරික්තය ගණනය කිරීමේදී වර්ෂයට අදාල ආදායම් පමණක් නිවැරදිව හඳුනාගෙන ගැළපීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අධිකාරියේ විභාග හා ඇගයීම් අංශයෙන් හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහතිකපත් නිකුත් කිරීමේ අංශයෙන් ලද තොරතුරු අනුව, NVQ සහතික පත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අධිකාරිය විසින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.8,156,600 ක් ගිණුම් ගත කර නොතිබුණි. | දැනට මෙම ගෙවීම් සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් ඉදිරියේදී එළඹෙන එකඟතාවය මත 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මෙම ගෙවීම සිදු කිරීමට කටයුතු කරනු ඇති බව. | මූල්‍ය ප්‍රකශන මගින් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කිරීම සඳහා වර්ෂයට අදාළ සියලුම ගනුදෙනු ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විශේෂ ව්‍යාපෘතීන් ඉටු කිරීම වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත විවිධ ආයතන විසින් 2022 වර්ෂයේදි හා ඊට පෙර වර්ෂවලදි ලබා දී තිබුණු එකතුව රු.45,326,885 ක් තැන්පතු ගිණුමකට බැර කිරීම වෙනුවට ගෙවිය යුතු වියදම් ගිණුමට බැර කර තිබුණි. | ව්‍යාපෘතින්ගෙන් ලද ඉදිරි වර්ෂයන්හිදී වියදම් කිරීමට අපේක්ෂිත මුදල් මෙම ගිණුමේ සටහන් කර ඇති අතර මෙම මුදල් 2023 වර්ෂයේ දී වැය දැරීම සිදු කරනු ඇති බව. | විශේෂ ව්‍යාපෘතීන් ඉටු කිරීම වෙනුවෙන් ලැබෙන මුදල් අදාළ වර්ෂය තුළදීම උපයෝජනය කිරීමට හෝ ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | විශේෂ ව්‍යාපෘති ප්‍රදාන | 13,266,934 | ව්‍යාපෘති පිළිබඳ විස්තර හා එක් එක් ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සහ මුදල් නිදහස් කිරීම පිළිබඳ ලිපි | විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන ලැබීම් වලට අදාල ලිඛිත සාක්ෂි ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කර තිබූ විශේෂ ව්‍යාපෘති ලැබීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | හුවමාරු නොවන ගනුදෙනුව ලින් ජනිත වූ ප්‍රාග්ධන ප්‍රදාන අයහාරය | 18,632,491 | එම | ප්‍රතිපාදන ලැබීම් වලට අදාල ලිඛිත සාක්ෂි ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කර තිබූ හුවමාරු නොවන ගනුදෙනුවලින් ජනිත වූ ප්‍රාග්ධන ප්‍රදාන අයහාරවල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2003 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලසීමාව ඇතුලතදී සේවයෙන් ඉවත් වී තිබුණු නිලධාරීන් 35 දෙනෙකුගෙන් අධිකාරිය වෙත අයවිය යුතු රු.20,246,792 ක මුදල 2023 ජූලි 26 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම නිලධාරින් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත යොමු කර ඇති බව. | සේවයෙන් ඉවත්වන නිලධාරීන්ගෙන් අයවිය යුතු සියලුම මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරිය වෙත රජයේ ආයතන 03 කින් ලැබිය යුතු එකතුව රු.5,512,969 ක් වූ ශේෂ වර්ෂ 10 ක් ඉකුත් වී තිබුණද 2023 මැයි 31 දින වන විටද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති PED/01/2021(i) අංක දරණ හා 2023.05.16 දිනැති චක්‍රලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන බව. | දීර්ඝ කාලීනව හිඟ හිටි ශේෂ ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමටත් ප්‍රමාණවත් අඩමාන ණය වෙන්කිරීමටද කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉඩමෙහි නිරවුල්භාවය පිලිබඳ සැලකිලිමත් නොවී නුවරඑළිය වනරාජවත්ත ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙන් රූඩ් 3 පර්චස් 31.3 ක් අධිකාරිය වෙත පවරා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 2018 අප්‍රේල් 25 දින ගෙවන ලද රු.9,280,000 ක් ගෙවා තිබුණු නමුත් වසර 05 ක් ගතවන විටද ඉඩමෙහි අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට හෝ ගෙවන ලද මුදල් අයකර ගැනීමට හෝ නොහැකි වී තිබුණි. | වනරාජවත්ත ඉඩම සඳහා මේ වන විට නඩු කටයුත්තක් පවතින බැවින් එය නිරවුල් වීමෙන් පසු එම මුදල පියවීම සිදු කරන බව. | ඉඩමේ නිරවුල් අයිතිය පිලිබඳ අවධානය යොමුකර ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මුදල් ගෙවිය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) | යම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 12 කදී රු.100,500 සිට රු.340,404 ක පරාසයක් තුල එකතුව රු.1,788,693 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | ඉදිරියේදී උපරිම සීමාව තුළ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ යුතු බව මුදල් අංශයට උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 221/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු.7,659,583,443 ක් වූ දේපළ පිරියත හා උපකරණවල නිවැරදිභාවය | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | දේපළ පිරියත හා උපකරණවල නිවැරදිභාවය තහවුරුකර ගැනීමට විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් |

| | | | |
|---|---|---|---|
| මාර්ගෝපදේශ යේ 8.1 හා 8.2 ජේද | තහවුරු කර ගැනීමට අවශ්‍ය විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | | පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.544,059,934 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.327,145,399 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.216,914,535ක තවදුරටත් පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන අඩුවීම හා කාර්යමණ්ඩල හා අනෙකුත් මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ (SSDP) මූල්‍ය ප්‍රතිපාදන මත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 03 ක නවීකරණ කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේදී උපදේශක සමාගම් වෙත රු.1,212,570 ක් ගෙවා තිබුණු නමුත් එම නවීකරණ කටයුතු 2023 ජූලි 31 දින දක්වාම ආරම්භ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි. | SSDP ව්‍යාපෘතිය විසින් එක් එක් වසරවලදි ලබා දෙන ලද ප්‍රතිපාදන සීමාසහිත වූ බැවින් එම මධ්‍යස්ථාන 3හි ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වුණි. එහෙත් ලබා දෙන ලද සැලැසුම් හා ඇස්තමේන්තු (ප්‍රමාණ පත්‍ර) ඉදිරියේදි ප්‍රයෝජනයට ගැනීම සඳහා අප සතුව ඇත. තවද මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් උපදෙස් ලබා ගෙන ඇති අතර එය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව. | දරන ලද වියදමට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු සැලසුම් කරගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව අධිකාරියේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අයත් පුහුණු මධ්‍යස්ථාන 11 ක පවත්වන ලද පාඨමාලා 13 ක් සඳහා බඳවාගත් ආධුනිකයන් හා ඉලක්කගත සංඛ්‍යාව සමඟ සැසඳීමේදී, බඳවා ගැනීම් ප්‍රතිශතය සියයට 10 සිට සියයට 66 දක්වා අඩු මට්ටමක පැවතුණි. එමෙන්ම එම පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 20 සිට සියයට 58 දක්වා පරාසයක් ගෙන තිබුණු අතර එම පාඨමාලා හැරයාමට හේතු සොයා බලා ඒවාට අවශ්‍ය පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | විවිධ අවස්ථාවල පාඨමාලාවල පැවති හේතු සාධක හා අනුබද්ධිත පුහුණු මධ්‍යස්ථානවල පවතින විවිධ පාලන ගැටළු තත්ත්වයන් මතද 2019 සහ 2020 වර්ෂයන්හි පැවති කොරෝනා වසංගත තත්වයන් හේතුවෙන් පාඨමාලා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අපහසු විය. | පුහුණු මධ්‍යස්ථානවල පවතින විවිධ පාලන ගැටළු තත්ත්වයන් අවම කිරීමට කටයුතු කළයුතු අතර සිසුන් පාඨමාලා හැරයාමට හේතු සොයා බලා ඒවාට අවශ්‍ය පිළියම් යෙදීමට කළමනාකරණය වහාම කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරය දරන කාලපරිච්ඡේදය තුලදීම හා එනම් 2006 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස සේවය කරමින් ආයතන දෙකෙන්ම දීමනා සහ ප්‍රවාහන පහසුකම් ලබාගත් නිලධාරියා මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් මාසික දීමනා වශයෙන් රු.5,443,723 ක් ලබාගෙන ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස 2015 ඔක්තෝබර් 20 දිනැති ලිපිය මගින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකාරියේ සභාපති වෙත දන්වා ඇතත් එම පරීක්ෂණය 2023 ජූලි 30 දින වන විටද සිදුකිරීමට නොහැකි වී තිබුණි. | මෙම හිටපු අධ්‍යක්ෂ (පාලන) මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත සේවයෙන් නිදහස් කිරීම ජනාධිපති ලේකම්ගේ දැනුම් දීම මත 2005.12.23 දින සිදු කර ඇත. COPE කමිටු රැස්වීමේදී ලබා දී ඇති උපදෙස් අනුව ජනාධිපති ලේකම්ගෙන් අවස්ථා 2කදී උපදෙස් ඉල්ලා යැවූ නමුත් අමාත්‍යාංශ වෙනස්වීම මත අවශ්‍ය උපදෙස් නොලැබුණි. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් විමසා නැවත ජනාධිපති ලේකම් වෙත 2023.04.19 දින ලිපියක් යොමු කිරීමට කටයුතු කර ඇති බව. | කඩිනමින් අවශ්‍ය උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා හදාරන සිසුන්ගේ වැඩිදුර පුහුණු කටයුතු සඳහා සහ වඩා හොඳ පුහුණුවක් ලබාදීමේ පරමාර්ථයෙන් අහංගම හෝටල් පාසැල රු.මිලියන 148.92 ක් වැයකර 2019 වර්ෂයේදී හෝටලයක් ලෙස නවීකරණය කර තිබුණද එම වර්ෂයේ සිට 2023 ජුනි 30 දක්වාම මෙම සංචාරක හෝටලය තුලින් කිසිදු ආධුනිකයෙකුට ප්‍රායෝගික පුහුණුව ලබා දී නොතිබුණි. | මෙම හෝටලය ප්‍රසම්පාදන ක්‍රමවේද භාවිතා කරමින් නීත්‍යානුකූල ලෙස පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ ආයතනයක් වෙත දීර්ඝකාලීනව බදු දීමටත් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද මඟින් ආයෝජකයින් තෝරා ගැනීමටත් උපදෙස් ලබා දී අනුමැතිය ලබා දී ඇත .තවද අදාළ බදු හිමිකරු විසින් අපගේ ආධුනිකයින් වැඩිදුර පුහුණුවට බඳවා ගත යුතු බව බදු ගිවිසුම්වල සඳහන් කළ යුතු බව දැනුම් දී ඇති බව. | වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ පනතෙහි දක්වා ඇති අරමුණු අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපාතියෙහි අරමුණට පටහැනිව පරිගණක පාඨමාලාවක් සඳහා රු.11,721,081 ක් වැයකර පරිගණක 30 ක් හා පරිගණක උපාංග මිලදී ගෙන තිබුණි. | 2019 වසරේදී තොරතුරු තාක්ෂණ ශිල්පී (NVQ Level IV) පාඨමාලා 10 ක් රැකියා වෙළඳපොළ වැඩි ඉල්ලුමක් පවතින පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී පාඨමාලා බවට පරිවර්තනය කරන ලද අතර ඒ සඳහා අවශ්‍යවන උපදේශක පුහුණුවීම සහ පංති කාමර සකස් කිරීම් ආදී අනෙකුත් සියළු අවශ්‍යතා ඉටු කළද භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමිත වූ බැවින් එම පාඨමාලා සඳහා අවශ්‍ය පරිගණක මිළදී ගැනීමට 2020 වර්ෂය තෙක් අවස්ථාව නොලැබුණු බව. | විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් ලද ප්‍රතිපාදන එම අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කිරීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (සියයට 100 ක) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින කැබිනට් අනුමැතියක් රහිතව අධිකාරියේ අරමුදල් වලින් VTA Holdings Ltd නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ සමාගම ඈවර කිරීමට අවශ්‍ය ලේඛන 2022 ජූනි 20 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කර තිබුණි. සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් ලබා දී තිබුණද එම වාර්තාව 2023 ජූලි 20 දින වන විටද සකස් කර නොතිබුණි. | මෙම සමාගම මෙම අධිකාරියේ නිලධාරී මණ්ඩලයක් මගින් පාලනය නොවුනු බැවින් මෙම සමාගම පිළිබඳව මූලික වාර්තාවක් ලබා දීමට කමිටුවක් දැනටමත් පත් කර ඇත. මෙම කමිටු වාර්තාව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවට හා ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිත බව. | අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 හා 2022 වර්ෂවලදී ඇනවුම් කරන ලද එකතු වටිනාකම රු.28,078,556 ක් වූ උපකරණ වර්ග 19 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සැපයුම්කරුවන් විසින් අධිකාරිය වෙත සපයා නොතිබුණි. තවද, 2019 හා 2022 වර්ෂයේදී ඇනවුම් කර, අධිකාරියට ලැබී තිබූ උපකරණ වලින් රු.4,589,944 ක්වූ අයිතම වර්ග 07ක් පිරිවිතරයන්ට නොගැලපීම නිසා ප්‍රතික්ෂේප කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 වන විටද එම අයිතම නැවත සපයා නොතිබුණි. | මෙම පුහුණු උපකරණ අයිතමයන්ද සපයා දීමට නොහැකි වී ඇත්තේ ආනයනික සීමා හේතුවෙන් බව අදාළ සැපයුම් ආයතන විසින් ලිඛිතව අධිකාරිය වෙත දැනුම් දී ඇත. තවද ඇතැම් සැපයුම්කරුවන් විසින් ලබා දුන් උපකරණ අවසන් තාක්ෂණික ඇගයීම් සමග පිරිවිතරයන්ට නොගැලපීම හේතුවෙන් එම අයිතම භාර නොගත් අතර එම සැපයුම්කරුවන්ට නිවැරදි පිරිවිතර මත භාණ්ඩ සපයන ලෙස දන්වා තිබූ නමුත් රටෙහි පැවති ඩොලර් අර්බුදය මත එම උපකරණ ආනයන සීමා මත සැපයිය නොහැකි බව දන්වා ඇති බව. | කළමනාකරණය විශේෂ අවධානය යොමු කර 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ව්‍යාපෘතිය සඳහා අවශ්‍යය උපකරණ ලබදීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භකරන ලද වැඩහල් ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කරන ලද රු.19,053,095 ක් 2017 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩ ගිණුම තුල දක්වා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් අතරමඟ නවතා දැමීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකරන ලද කොටස් දිරාපත් වෙමින් පැවතුණි. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හේතුවෙන් ඉදිකිරීම් වැඩ අවසන් කළ නොහැකි වූ හෙයින් 2015.01.05 දින ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලද නමුත් පෙර ව්‍යාපෘතිය විධිමත්ව අවසන් කර නොතිබීම නිසා (ප්‍රසම්පාදන | අතරමග නවතා ඇති ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර භාවිතයට ගතහැකි තත්ත්වයට පත්කරගැනීමට වහාම ක්‍රියා කළ යුතු අතර කොන්ත්‍රාත්කරුට විරුද්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට |

| | | |
|---|---|---|
| | කමිටු තීරණය නොලැබීම හේතුවෙන්) නැවත ඉදිකිරීම් කටයුතු කිරීමට මෙතෙක් නොහැකි වී ඇති බව. | පියවර ගත යුතුය. |
| (ආ) ඔරුගොඩවත්ත ශ්‍රී ලංකා ජාතික වෘත්තීය පුහුණු ආයතනය සඳහා 2020 වර්ෂයේදී කොරියානු රජයේ ආධාරයෙන් සිසුන් 100 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි කාමර 48 කින් යුත් සියලු පහසුකම් සහිත ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදි කර තිබුණි. එහෙත් විගණිත දිනය වූ 2023 ජූනි 30 වන විටද පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණු අතර උපදේශකවරුන් 14 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් ලබා දී තිබුණි. එමෙන්ම, 2022/2023 වර්ෂයේ පාඨමාලාවලට සම්බන්ධ වූ සිසුන් 400 දෙනෙකුගෙන් සිසුන් 110 කට ආසන්න සංඛ්‍යාවක් පුහුණු ආයතනය පිහිටි බස්නාහිර පළාතෙන් පිටත ස්ථිර පදිංචිය සහිත සිසුන් වන අතර එවැනි සිසුන්ට සහනයක් සැලසීම තුලින් වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් යොමුවීමේ වර්ධනයක් සිදුවන ආකාරයෙන් කටයුතු කර නොතිබුණි. විදේශාධාර (ණය) උපයෝගී කරගෙන ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල වසර 03 ක සිට අදාල අරමුණට යොදා නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. | මේ වන විට ආයතනයේ උපදේශකවරුන් සඳහා මාසික දීමනාවක් අයකර ගෙන නේවාසික පහසුකම් ලබා දී ඇති බව. | සිසුන්ට සහනයක් සැලසීම සහ වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් යොමුවීමේ වර්ධනයක් සිදුවන ආකාරයෙන් නේවාසිකාගාර පහසුකම් සිසුන් වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හා යාපනය දිස්ත්‍රික්කයේ කරෛනගර් හෝටල් පාසැල් පරිශ්‍රය තුල අධිකාරියේ අරමුණින් බැහැරව සංචාරකයින් සඳහා ලබාදීමේ අරමුණ ඇතිව රු.91,026,186 ක් වැයකර ඉදිකර තිබූ කාමර 22 ක් 2023 ජූලි 30 දින වන විටද ඌන උපයෝජිතව පැවතුණි. | පොතුවිල් හා කරෛයිනගර් හෝටල් පාසල් ද විධිමත්ව බඳු දීමට නියමිත බව. | වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ පනතෙහි දක්වා ඇති අරමුණට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, 2023 වර්ෂය සඳහා සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවම ලංසුකරු වෙත ලංසු වලංගු කාලය තුල කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු නොකිරීම නිසා දෙවන ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් රු.2,038,700 ක් වැඩි මිලකට සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමට සිදුවී තිබුණි. | මෙම තත්වය ඇතිවීමට හේතු වී ඇත්තේ නව සභාපතිවරයෙක් පැමිණීම, අමාත්‍යාංශය මඟින් එම සභාපති ප්‍රසම්පාදන කමිටුවට පත් කිරීම හා මෙම ලිපි ගොනුව අධ්‍යනය කිරීම සඳහා සැළකිය යුතු කාල සීමාවක් ගත වීම හේතුවෙන් බව. | අධිකාරියට අලාභයක් සිදු වීමට කටයුතු නොකර ප්‍රසම්පාදන කාලසටහන අනුව කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |